JSS 2024 2(2): 104-118
Journal of Social Sciences (JSS)
Volume 02 – Issue 02

DOI: https://doi.org/10.4038/jssnisd.v2i2.16

DRUGS: YOUTH AND PHYSICAL, MENTAL, SOCIAL PROBLEMS

Adhikari K.L.

National Institute of Social Development, Sri Lanka

ABSTRACT

This study explores the physical, mental, and social challenges faced by youth as a result of drug addiction, focusing on individuals receiving care at the Centre for Rehabilitation and Treatment of Drug Addicts in the Avissawella Puwakpitiya region of Sri Lanka. The research specifically targeted 44 male clients, aged 18 to 24, who were undergoing residential rehabilitation. Employing a qualitative, post-objectivist research approach, data were gathered through targeted interviews and free-ranging discussions, enabling a comprehensive understanding of the issue. The findings reveal that drug addiction significantly affects the physical health, mental well-being, and social functioning of young individuals. Physically, drug dependency leads to deteriorated health, reduced energy levels, and increased vulnerability to chronic illnesses. Mentally, addiction contributes to depression, anxiety, and diminished cognitive abilities, hindering personal and professional development. Socially, these individuals face stigma, isolation, and disrupted relationships, exacerbating their marginalization within their communities. On a broader scale, the study highlights the detrimental impact of youth drug addiction on Sri Lanka's labor force, particularly as it pertains to the economic contributions of young individuals, who are key drivers of societal progress. This erosion of the youth's potential has cascading effects on economic stability and social cohesion, emphasizing the urgent need for effective intervention strategies. This article underscores the interconnectedness of the physical, psychological, and social dimensions of drug addiction among youth and calls for a multidimensional approach to rehabilitation, prevention, and societal reintegration. The findings contribute to the global discourse on youth drug addiction and provide a foundation for targeted policy development and community-based interventions.

KEYWORDS: Youth community, drugs, addiction, physical, psychological and social problems.

හැඳින්වීම

ශ්‍රීන ලාංකේය සමාජය තුළ මෙන්ම බොහෝ රටවල ද වර්තමානය වනවිට විෂ මත්ද්‍රcවියd භාවිතය සුලභව සිදුවේ. නාගරීකරණ හා ගෝලීයකරණ ප්‍රදවණතා හමුවේ මෙම තත්ත්වය වර්තමානයේ තවදුරටත් ව්‍යාප්ත වෙමින්පවතී. නාගරික මෙන්ම ග්‍රාතමීය ප්‍ර දේශයන්හි මත්ද්‍ර0විය– සඳහා පවතින ඇබ්බැහියේ ක්‍රීමානුකූල වර්ධනයක් නූතනය තුළ දැකිය හැකිය. මෙහි විශේෂත්වය වන්නේරටක අනාගතයෙහි උරුමකරුවන් වන තරුණ ප්‍රජාව මත්ද්‍රිවිය.යෙහි සෘජු ගොදුරක් බවට පත්වීමය. වාර්ෂිකව මත්ද්‍රරවිය භාවිත කරන්නන් ප්‍රමාණාත්මකව වර්ධනයඅතර එහි අනිසි ප්‍රතිවිපාක ද වර්ධනය වෙමින් පවතී. මෙමගින් පුද්ගල ජීවිතයේ සියලුම පැතිකඩ වලට හානි පමුණුවන අතරම අවසාන වශයෙන් සමස්ත සමාජයේ ප්‍රපගමණයට ද සෘණාත්මක බලපෑම් එල්ල කරයි. මේ නිසා මත්ද්‍රවව්‍ඇබ්බැහිය සමකාලීන සමාජ සන්දර්භයන් හි සමාජ ප්‍ර ශ්නයක් (Social Problem) වශයෙන් නිර්වචනය කර ඇත. ඒ තුළ ක්ෂුද්‍රස මට්ටමෙන් මෙන්ම සමාජය තුළ සාර්ව මට්ටමෙන් ද විසඳුම් සෙවිය යුතු ගැටලුවක් ලෙස මේ තත්ත්වය තවදුරටත් අර්ථකථනය කර දැක්විය හැකිය.

ශ්‍රී ලංකාව තුළ වර්තමානය වනවිට පවා මත්ද්‍ර්විය ඇබ්බැහිය වැළැක්වීමේ අරමුණින්බොහෝ ක්‍රියාමාර්ග ගෙන ඇත. බන්ධනාගාරගත කිරීම්, ඇබ්බැහිවූවන් ප්‍රේජාවිශෝධන ක්‍රිහයාවලියට ලක් කිරීම, උපදේශන සේවා සැපයීම මෙන්ම පුනරුත්තාපනය මේ අතර දැක්විය හැකිය.

මෙලෙස රාජ්‍යී මට්ටමෙන් මෙන්ම රාජ්‍යු නොවනමට්ටමෙන් බොහෝ ක්‍රියාමාර්ග ගෙන ඇතත් වර්තමානය වනවිටත් මත්ද්‍රටවිය ඇබ්බැහිතාව දැකගත හැකිය. එහිලා පවතින ක්‍රවමවේදයන්ගේ යම් වෙනසක් ඇති විය යුතු බව පැහැදිලි වේ.

එසේම මත්ද්‍රවවියය ඇබ්බැහිතාව පාලනය කිරීමෙහිලා විවිධ වෘත්තිකයින්ගේ වෘත්තිය දැනුම හා වෘත්තීය මැදිහත්කරණය අවශ්‍යු වේ. සමාජ සේවා නිළධාරීන්, පුනරුත්ථාපන නිළධාරීන්, ප්‍රඥජා විශෝධන නිළධාරීන්, බන්ධනාගාර නිළධාරීන්, සංවර්ධන නිළධාරීන්, වෛද්‍යපවරුන් මෙන්ම උපදේශන නිළධාරීන් ද මේ අතර වේ. ඔවුන්ගේ වෘත්තීය කාර්යභාරය එකිනෙකට වෙනස් වන අතරම, ඔවුන් වෘත්තීය සීමාව තුළ මත්ද්‍රේවියක ඇබ්බැහිතාව වැළැක්වීමෙහිලා ක්‍රිපශීලීත්මක

තරුණවියේදී ඇති වන වෘත්තීය ගැටලු, ගෘහස්ථ හිංසනය, අනිසි ඇබ්බැහිවීම්, දූප්පත්කම, ළමා අපරාධ සහ මාර්ග අනතුරු වැනි සමාජ ගැටලු ගණනාවක් වර්තමාන ලෝකයේ දැකගත හැකි අතර ඒ සියල්ලම පුද්ගලයන්ට හා සමාජවලට අහිතකර ලෙස බලපෑම් ඇතිකරනු ලබයි. මෑත කාලීන ලෝකයේ විශාලතම ගැටලුව බවට පත්ව ඇත්තේ මිනිසුන් මත්ද්‍රපව්‍යුවලට ඇබ්බැහිවීමයි. මත්ද්‍රලවියල භාවිතයේ යෙදෙන බොහෝ පුද්ගලයින් පවසන්නේ මත්ද්‍රලභාවිතය පෞද්ගලික දෙයක් බවත් ඔවුන්ගේ පෞද්ගලික හැසිරීම්වලින් තමන්ට පමණක් හානියක් වන බවත් අන්අයට එසේ නොවන බවත්ය (Dissabandara, 2000).

කෙසේවෙතත් මත්ද්‍රගව්‍යෘවලට ඇබ්බැහිවූවන් එය නිර්වචනය කරන ආකාරය තරම්ම එය සරල නොවන බව සියලුදෙනාම දන්නා කරුණකි. මත්ද්‍රවවිය් වලට ඇබ්බැහිවීම මත්ද්‍රලවියෞ භාවිත කරන පුද්ගලයන්ට පමණක් නොව ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට සමාජයට හා මුලු රටටම බලපාන බහු මුහුණුවරකින් යුතුව පැතිරුණු සමාජ ගැටලුවකි. මත්ද්‍ර වියට සමස්ත ලෝකයේ මිනිස් වර්ගයාට හානි කරවන්නේ එහි ඇබ්බැහිවීමේ ස්වභාවය මත නොවේ. ඒ සඳහා ගොදුරුවන්නේ රටේ අනාගතය භාර ගැනීමට සිටින්නාවූ තරුණයන් වන බැවිනි (Brill, 1996).

පර්යේෂණ ගැටලුව

මත්ද්‍රව්‍යයට භාවිතය හේතුවෙන් තරුණයින් මුහුණ පාන කායික, මානසික හා සමාජීය ගැටළු මොනවාද යන්න පර්යේෂණ ගැටලුව වේ.

මත්ද්‍ර ව්‍යප ඇබ්බැහිතාව පිළිබඳ ගැටලුව දිනෙන් දින ඉහළ යමින් පවතින ගැටලුවක් වන අතර ඔස්සේ ඇබ්බැහිතාව සහිත පුද්ගලයන් සෞඛ්‍යප හා සමාජ ගැටලු වට ගොදුරුවීමේ අවදානමට මුහුණ පා සිටිය s (Jackson, 2013). ඇස්තමේන්තුගත දත්ත වාර්තාවලට අනුව ජනගහනයෙන් මිලියන 155 ත් 250 ත් (වයස 15ත් 64ත්) අතර ප්‍ර මාණයක් පසුගිය වසර තුළ නිත්‍යවනුකූල නොවන මත්ද්‍රවව්‍යත භාවිත කර ඇත. ලෝක මත්ද්‍ර ව්‍යම වාර්තාවට අනුව මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයන් 06 ගෙන් එක් අයෙකු මත්ද්‍ර ව්‍යම භාවිත අක්‍රමතාවෙන් (SUD - Substance Use Disorder) පෙළෙන අතර, ඒ සඳහා ප්‍රතිකාර ද ලබාගනී (World drugs report, 1990).

මෙම පර්යේෂණය මගින් මත්ද්‍රව්‍ය ඇබ්බැහිතාවට ලක්ව සිටින තරුණයින් මුහුණපාන ගැටලු මොනවාද යන්න සොයාබැලීම අපේක්ෂිත විය. එහිදී මූලික වශයෙන් මත්ද්‍රව්‍යා භාවිතය පදනම් කරගනිමින් තරුණයින් මුහුණපාන කායික, මානසික හා සමාජීය ගැටලු පිළිබඳ සොයා බැලිණ.

සාහිත්‍යන විමර්ශනය

වර්තමානයේ මත්ද්‍රව්‍යක ගැටලුව දේශීය වශයෙන් පමණක් නොව විදේශීය වශයෙන් ද මහත් ව්‍යසනයක් ගෙනදෙන සමාජ ගැටලුවක් බවට පත් වී තිබේ. මෙම ගැටලුව බාල, තරුණ, මහලු වයස් භේදයකින් තොරව පුද්ගලයන් කෙරෙහි ප්‍ර බල බලපෑමක් ඇතිකරයි. වර්තමාන තරුණයින් හා නව යොවුන්වියේ පුද්ගලයින් මත්ද්‍රව්‍ය දූර්භාවිතය වැනි සමාජ අපගාමී ක්‍රියාවන්වල නිරත වීම රටක ඉදිරි අනාගතය පිළිබඳ අවිනිශ්චිතතාවයක් මතුවීමට ප්‍රධාන හේතුවක් ලෙස දැක්විය හැකිය.

තරුණවිය

පුද්ගලයා ජීවිත කාලය තුළ පසුකරන අවධි අතර තරුණවිය සුවිශේෂී කාණ්ඩයකි. තරුණවිය පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇත. ලෝක සෞඛ්‍යක සංවිධානයටඅනුවවයස අවුරුදු 15 - 24 ත් අතර වයස් කාණ්ඩය තරුණයින් ලෙස අර්ථ දක්වා ඇත. ඇමරිකා එක්සත් සංවිධානය, ලෝක කම්කරු සංවිධානය සහ යුනිසෙෆ් වැනි සංවිධාන විසින් නවයොවුන් විය සහ තරුණ විය සම්බන්ධයෙන් විවිධ නිර්වචන ඉදිරිපත් කොට ඇත. ලෝක සෞඛ්‍යත සංවිධානයේ නිර්වචනයට අනුව තරුණයින් ලෙස හඳුන්වනු ලබන්නේ වයස අවුරුදු 15 - 24 ත් වයස් කාණ්ඩයන්ට අයත් පුද්ගලයින් වන අතර නවයොවුන්වියේ පුද්ගලයින් ලෙස හඳුන්වනු ලබන්නේ වයස අවුරුදු 10 - 19 ත් අතර වයස් සීමාවන්ට අයත් පුද්ගලයින් වේ (world Helth organization, 2020). එක්සත්ජාතීන්ගේ සංවිධානයට අනුව තරුණයින් යනු අවුරුදු15 - 24 ත් අතර පුද්ගලයින්ය. ශ්‍රී කා ජාතික මානව සංවර්ධන වාර්තාවට අනුව වයස අවුරුදු 15 - 29 අතර වයස් කාණ්ඩය තරුණයන් ලෙස අර්ථ දක්වා ඇත. UNDESA ට අනුව යෞවන වයස යනු පුද්ගලයෙකු දරුවෙකුගේ සිට වැඩිහිටියෙකු දක්වා පරිවර්තනය වනකාල පරාසයයි. මෙම කාල වකවානුව තුළ

ඔවුන් වේගවත් මානසික හා භෞතික සංවර්ධනයක් ඇති කරගන්නා අතර මෙය රටකින් රටකට වෙනස්වන අතර ඔවුන්ගේ භූමිකාව අනුව ද වෙනස්වේ.

මත්ද්‍රව්‍ය භාවිතය

පුද්ගලයෙකුගේ මානසික , ශාරීරික හෝ ජෛව රසායනික තත්ත්වය වෙනස් කළහැකි ඕනෑම ද්‍රව්‍යයක් මත්ද්‍රව්‍යයක් ලෙස අර්ථ දැක්වේ (ලෝක සෞඛ්‍ය සංවිධානය, 2016). මත්ද්‍රව්‍ය දුර්භාවිතය හේතුවෙන් මත්ද්‍රව්‍යවලට හුරුවීමටත් ඒ මත යැපෙන්නට පටන් ගැනීමත් සිදුවේ. මෙම තත්ත්වය මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම ලෙසහඳුන්වනු ලැබේ. නිතර මත්ද්‍රව්‍යයක් භාවිත කිරීම නිසා ක්‍රමක්‍රමයෙන් භාවිත කරන ප්‍රමාණය වැඩිකිරීමට භාවිත කරන්නාට සිදුවේ. මෙම තත්ත්වය මත්ද්‍රව්‍යයට හුරුවීමයි. මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයකු ශාරීරිකව හෝ මානසිකව හෝ ඒ දෙආකාරයෙන්ම හෝ ඇබ්බැහියට පත්වේ.

මත්ද්‍රව්‍ය වර්ගීකරණය කළහැකි ප්‍රධානආකාර කිහිපයක් ඇත.

(A) On the basis of the type of manufacture - - නිෂ්පාදනය කරන ආකාරය අනුව
(B) On the basis of the U.N. Convention - - එක්සත්ජාතීන්ගේ සම්මුතීන් අනුව
(C) On the basis of psycho-active effects - මනෝ-ක්‍රියාකාරී බලපෑම් අනුව

මෙම මත්ද්‍රව්‍ය ස්වභාවික කෘතිම හෝ අර්ධ කෘතිම ලෙස පවතී. මත්ද්‍රව්‍ය ප්‍රධාන වශයෙන් කොටස් 02 කි. එනම්,

01.නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය
02.නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය

නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය ලෙස මත්පැන් සිගරට් සහ දුම්කොළ භාවිතා කරන අතර නීත්‍යා නුකූල නොවන මත්ද්‍රව්‍ය ලෙස ගංජා හෙරොයින්, එක්ස්ටසි, කොකේන්, එල් එස් ඩී භාවිතා කරනු ලබයි (Espejo, 2002). මෙම මත්ද්‍රව්‍ය ප්‍රධාන කාණ්ඩ හතරකට බෙදිය හැකිය.

වගුව 1
මත්ද්‍රව්‍ය වර්ගීකරණය

උත්තේජක	**මාදක (ඔපියොයිඩ්ස්)**	**අවපීඩක**	**භ්‍රාන්තකාරක**
කොකේන්	හෙරොයින්	මද්‍යසාර	LSD
ඇම්ෆෙටමයින්	මෝෆීන්	බාබිචුරේට්ස්	මැස්කලයින්පයට්
මෙතැම්ෆිටමයින්	අබිං	බෙන්සොඩයිසිෆැම්ස් ගැමා	එක්ස්ටසි
නිකොටින් කැෆේන්	ඩෙමරෝල්	හයිඩ්‍රොක්සිබියුරේට්ස් රයිෆනෝල්	මෂ්රූම්ස්

මූලාශ්‍රය - (කරුණානායක 2012: පි.2-27)

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම

පුද්ගලයාටත් සමස්ත සමාජයටත් අහිතකර ලෙස බලපාන එමෙන්ම වැළැක්වීම, පාලනය කිරීමට ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් විවිධ ක්‍රියා මාර්ග ගනු ලබන සමාජගත ප්‍රශ්නයක් ලෙස මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවීම (Drugs Addiction) හඳුනා ගත හැකිය. මත්ද්‍රව්‍ය භාවිතය (Drugs Use) යොමුවීමෙහි දීර්ඝකාලීන ප්‍රතිඵලයක් ලෙස හඳුනා ගත හැකි "මත්ද්‍රව්‍ය ඇබ්බැහිය" යනු කුමක්ද යන්න සොයන විට ඇබ්බැහිකාරීත්වය (Addiction) අවබෝධය වැදගත්ය. Addiction යන ඉංග්‍රීසි වචනය ඇඩිසරේ (Addicere) නම් ලතින් වචනයෙන් බිහිවූවකි. යම් පුද්ගලයෙකු යම් දෙයකට පවත්වා ගෙනයන බැඳීම පෙන්වීමට මෙම වචනය භාවිතා කෙරේ. යමක් කිරීමට හෝ ලබාගැනීමට ඇති අවශ්‍යතාවය එසේත් නැතිනම් යමක් සඳහා ඇත s දැඩි කැමැත්ත ඇබ්බැහිය Addiction ලෙස ක්‍රේම්බ්‍රිජ් ඉංග්‍රීසි ශබ්දකෝෂය අර්ථ දක්වයි (www. dictionary. cambridge .org/dictionary english addition).

ඇබ්බැහිය,

යම් චර්යාවක් තම පාලනය තුළින් ඔබ්බට යෑම එසේ නැතහොත් යම් චර්යාවක් දිගින් දිගටම පාලනයකින් තොරව සිදුකිරීම වේ. එහිදී මත්ද්‍රව්‍යද භාවිතා කරන්නා තුළ පවතින ශාරීරික වෙනස දිගු කාලීනව පවත්වාගෙන යාම නිසා පුද්ගලයා ඇබ්බැහිවූවකු බවට පත්වේ (කරුණානායක, 2021).

මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම පිළිබඳ ජාතික ආයතනයට අනුව මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම නිදන්ගත නැවත ඇතිවන රෝගයක් ලෙස සංලක්ෂිත වේ (මත්ද්‍රව්‍යව භාවිතය පිළිබඳ ජාතික ආයතනය, 2018). මත්ද්‍රව්‍යයේ අනිසි භාවිතය පිළිබඳ ජාතික ආයතනය ළමුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමට හේතුව පැහැදිලි කරයි. ළමුන් හේතු කිහිපයක් නිසා මත්ද්‍රව්‍ය ලබාගනී. එනම්,කුතුහලය සහ සමාජ පීඩනය එහිදී ප්‍රධාන වේ (මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ජාතික ආයතනය, 2018).

ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරන විටබොහෝමයක් වයස අවුරුදු 14 - 19 අතර නව යොවුන්වියේ ළමුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටිති. ශ්‍රී ලංකාවේ බන්ධනාගාර සංඛ්‍යාත ලේඛනවලටඅනුව 2009, මත්ද්‍රව්‍ය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සිරකරුවන් බොහෝය. මෙම අධ්‍යයනය තුළදි මත්ද්‍රව්‍ය භාවිතය සහ තරුණවිය පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදුකරනු ලබයි.

ඉන් වැඩිපුරම බලපෑම් එල්ලවන්නේ අනාගත පරම්පරාවයි. ලොව නන් දෙසින් පැමිණෙන වාර්තාවලින් පැහැදිලි වන්නේ මත්ද්‍රව්‍යම කෙතරම් විශාලවසනකාරී ලෙස සමාජයට තර්ජනයක් වී ඇත්තේ ද යන්නයි. තරුණ තරුණියන් මත්ද්‍රව්‍ය වලට ඇදී යාමට හේතුවන මූලික කාරණා 05 ක් ජගත් සෞඛ්‍ය සංවිධානය ගෙන හැර දක්වා ඇත. ඒ තුල

- තමන් වැඩිහිටියන් බව පෙන්වීමට හා තමන්ටම තීරණ ගැනීමට හැකිබව පෙන්වීමට මත්ද්‍රව්‍යයි උපකාර වෙතැයි යන හැඟීම තම සමීපතමයන් සමඟ එකටපැහී කටයුතු කිරීමට ඇති වුවමනාව.

■ ජීවිතය සැහැල්ලුවෙන් ගත කරන්න හා සතුටක් ලැබීමට මත්ද්‍රව්‍යප උපකාරී වෙතැයි යන හැඟීම.

■ අවදානම් සහිත දේවල් කිරීමට හා කැරලිකාර ස්වභාවයක් පෙන්වීමට ඇති කැමැත්ත.

■ කුතුහලය සන්සිඳුවා ගැනීමට තිබෙන ආශාව

ජීවිතය විනාශ කරන මේ මගෙහි යාමට තරුණයෙකු නැඹුරුවීමට තිබෙන ඉඩකඩ වැඩිවීමට මත්ද්‍ර ව්‍ය ලබා ගැනීමට තිබෙන හැකියාව මෙන්ම ඔහුගේ ආශ්‍රිතයන් ද හේතු වේ (SLANA News Letter, January to March 2015, Vol. 29).

ක්‍රමවේදය

මෙම පර්යේෂණ දිය ත් කි රීමට අදාළ පර්යේෂණ ක්‍රශමවේදය පිළිබඳ සාකච්ජා කිරිමේදී. පර්යේෂණයේ දර්ශනය (philosophy) වශයෙන් දත්ත මත පදනම්ව යමක් පැහැදිලි කිරීම හෙවත් යථානුභූතවාදය භාවිත කරන ලදි (positivism). එනම් පර්යේෂණයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී උපකල්පනය කරනු ලබන තොරතුරු වල බහුවිධ සාධකහඳුනා ගත හැකි නිසාවෙන් මෙම යථානුභූතවාදී දාර්ශනික පසුබිම උපයුක්ත කර ගන්නා ලදි. තවද දත්තදායකයින්ගේ මතුපිට පෙනෙන චර්යාවන්ට වඩා ගැඹුරු යථාර්ථයක් අධ්‍යකයනය තුළ මතු කර ගත හැකිහෙයින් පශ්චාත් ප්‍රනත්‍යඩක්ෂ මූලවාදය භාවිත කරන ලදි. පර්යේෂණයේ දර්ශනය අර්ථකථනවාදී (interpretative) දෘෂ්ටියකින් හඳුනා ගත හැකි අතර ක්‍ර මවේදාත්මක තත්ත්වය වන්නේ ගුණාත්මක පර්යේෂණ ක්‍ර මවේදය (qualitative research method)යි. මේ සඳහා පර්යේෂණ විධි ක්‍රාමය ලෙස සිද්ධි අධ්‍යේයන ක්‍රමවේදය භාවිත කරමින් දත්තදායකයින්ගේ තොරතුරු ඒකරාශී කරන ලදි.

අධ්‍යලයන ක්ෂේත්‍රිය

මෙම අධ්‍යයනය සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තෝරා ගන්නා ලද්දේ මත්ලෝලීන් පුනරුත්ථාපනය කිරිමේ හා ප්‍රතිකාර කිරිමේ මධ්‍යස්ථානයකි. මෙම ආයතනය බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රිකක්කයට අයත් උතුරු අම්බලන්වත්තුවක්පිටිය, අවිස්සාවේල්ල ප්‍රකදේශයේ පිහිටා තිබේ. මෙය සමාජසේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පුනරුත්ථාපන මධ්‍ය ස්ථානයකි.

පර්යේෂණ නියැදිය හා නියැදිකරණය

මෙම අධ්‍යහයනය සඳහා තෝරා ගත් ආයතනයේ විවිධ වයස් මට්ටම්වලට අයත් පිරිස් නේවාසිකව පුනරුත්ථාපනය වේ. 2021 වසරේ වාර්ෂිකව නේවාසිකව පුනරුත්ථාපනය සඳහා යොමු වූ සේවාලාභීන් ඔවුන්ගේ වයස් මට්ටම අනුව පහත පරිදි වර්ගීකරණය කර දැක්විය හැකිය.

වගුව 2

සේවාලාභීන්ගේ වයස් ව්‍යා්ප්තිය

අනුඅංකය	වයස් මට්ටම	ප්‍රමාණය
01	අවුරුදු 18 - අවුරුදු 25	44
02	අවුරුදු 26 - අවුරුදු 35	20
03	අවුරුදු 36 - අවුරුදු 40	12
	එකතුව	76

මූලාශ්‍ර (ක්ෂේත්‍ර දත්ත ඇසුරින්, 2022).

මෙම අධ්‍ය යනය සඳහා නේවාසිකව පුනරුත්ථාපනය වන වයස අවුරුදු 18 - 24 ත් අතර තරුණවියේ පසුවන සේවාලාභීන් 44 ක් අධ්‍යයන නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදි. ඒ සඳහා ප්‍රධාන හේතුව වූයේ මෙම අධ්‍යපයන ක්ෂේත්‍ර ය තුළ සුළභව දැකගත හැකි කණ්ඩායම වන්නේ තරුණ ප්‍රජාවයි. එසේම ඔවුන්රටේශ්‍ර ම බලකායට එකතු වීමට සිටින පිරිස වන අතර සමාජයට වඩාත් බලපෑම් කළ හැකි කණ්ඩායමක් ද වේ. ඔවුන්මෙ වැනි තත්ත්වයකට පත්වීම සමස්ත සමාජයට විශාල හානියක් ඇති කිරීමට හේතු වේ. සංඛ්‍යානත්මක දත්ත ඇසුරින් සලකා බැලීමේදී පැහැදිලි වන්නේ ද තරුණ ප්‍රකජාව වැඩි වශයෙන් මත්ද්‍ර ව්‍යි සඳහා ඇබ්බැහි වී ඇති බවය (අන්තරයාකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 2019: 9-10). මෙම අධියියනය සඳහා තෝරා ගත් නියැදියට අයත් සියලුදෙනාම පිරිමි සේවාලාභීන් වේ. නිවහනේ නේවාසිකව පුනරුත්ථාපනය වන්නේ පිරිමි සේවාලාභීන් පමණි. එසේම කාන්තාවන්ට සාපේක්ෂව පිරිමි පුද්ගලයින් මත්ද්‍ර ව්‍යන සඳහා ඇබ්බැහිවීමේ ප්‍රිවණතාව වැඩිය. ඒ බව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මගින් 2019 වර්ෂයේ සිදුකරන ලද මත්ද්‍රව්‍යත භාවිතයේ ව්‍යාමප්තිය පිළිබඳ ජාතික සමීක්ෂණයේ පහත අධ්‍යබයන දත්ත මගින් පැහැදිලිව්.

ප්‍ර ජා විද්‍යා්ත්මක තොරතුරු

වගුව 3

අධ්‍ය යන නියැදියේ වයස් ව්‍යා ප්තිය

අනු අංකය	වයස් මට්ටම	ප්‍රමාණය
01	අවුරුදු 15 - අවුරුදු 20	14
02	අවුරුදු 21 - අවුරුදු 25	30
එකතුව		44

මූලාශ්‍ර (ක්ෂේත්‍ර දත්ත, 2022).

වගුව 4

එසේම අධ්‍යයන නියැදියේ අධ්‍යාපන පසුබිම මෙසේ දැක්විය හැකිය.

අනුඅංකය	අධ්‍යාපන මට්ටම	ප්‍රමාණය
01	සාමාන්‍ය පෙළ දක්වා	27
02	සාමාන්‍ය පෙළ සමත්	08
03	සාමාන්‍ය පෙළ අසමත්	06
04	උසස් පෙළ සමත්	02
05	උසස් පෙළ අසමත්	01
06	උසස් අධ්‍යාපනය	00
	එකතුව	44

මූලාශ්‍රය: ක්ෂේත්‍ර දත්ත, 2022

අධ්‍යයනය සඳහා අධ්‍යයන නියැදිය තෝරා ගන්නා ලද්දේ අරමුණු සහගත නියැදි ක්‍රමය **(Purposive Sampling Method)** ඔස්සේ අධ්‍යයනයේ දී මත්ද්‍රව්‍ය සඳහා වැඩි ඇබ්බැහිතාවක් සහිත කණ්ඩායම වන තරුණ පිරිස් මෙම නියැදි ක්‍රමය ඔස්සේ අධ්‍ය යන නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදි. මෙම අධ්‍යයනයේ දී වාස්තවිකවාදී ඥාන සම්පාදන කාර්යයට භාවිත කරනු ලබන පශ්චාත් වාස්තවිකවාදී පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදි. මෙම අධ්‍යයනයේ දී ගුණාත්මක දත්ත රැස් කළ අතර ඒ ඔස්සේ සේවාලාභීන්ගේ ජීවිත පිළිබඳ වඩාත් විස්තරාත්මක දත්ත රැස්කර ගැනීමට අවකාශය හිමිවිය.

සොයා ගැනීම හා සාකච්ඡාව

තරුණ මත්ද්‍රව්‍ය ඇබ්බැහිය නිසා ඇති වන බලපෑම මත්ද්‍රව්‍ය සඳහා පුද්ගලයෙකු ඇබ්බැහි වූ විට එය පුද්ගල ජීවිතයේ විවිධ පැතිකඩයන්ට බලපෑම් කරයි. එසේම පුද්ගලයින් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවීම බලපානු ලබන්නේ හුදෙක් එය භාවිත කරනු ලබන පුද්ගලයාට පමණක් නොවේ. එය පුද්ගලයා හා බැඳුනු විවිධ පාර්ශ්වයන්ට බලපෑම් ඇති කරනු ලබයි. මත්ද්‍රව්‍ය ඇබ්බැහිතාව නිසා තරුණයින්ට ඇති කරනු ලබන බලපෑම පැතිකඩ කිහිපයක් ඔස්සේ විග්‍රහ කරනු ලැබේ.

කායික ගැටලු

මත්ද්‍රව්‍ය සඳහා යොමුවීම මූලික වශයෙන් බලපෑම් කරනු ලබන්නේ පුද්ගලයාගේ කායික පැතිකඩටයි. අධ්‍යයන නියැදිය තුළ විවිධාකාර මත්ද්‍රව්‍ය භාවිත කරන ලද පුද්ගලයින් හඳුනා ගත හැකි වූ අතර, ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගුව 5

නියැදියට අයත් සේවාලාභීන් භාවිත කරන ලද මත්ද්‍රව්‍යවල ස්වභාවය

අනු අංකය	මත්ද්‍රව්‍ය ස්වභාවය	සේවාලාභීන් සංඛ්‍යාව
1.	මෙතැම්පිටමින් (අයිස්)	24
2.	ගංජා	06
3.	හෙරොයින්	11
4.	LSD (Lysergic Acid Diethylamide)	03
	එකතුව	**44**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර දත්ත, 2022

2019 වර්ෂයට සාපේක්ෂව සලකා බැලීමේදී 2022 වර්ෂය වනවිට සාම්ප්‍රදායික මත්ද්‍රව්‍ය වලට වඩා අයිස් වැනි නව ප්‍රභේදයන්ගේ වැඩි ව්‍යාප්තියක් දැකගත හැකිය. නමුත් ගංජා හා හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිසක් තවදුරටත් සිටින බව අධ්‍යයන නියැදිය තුළ ද දැකගත හැකිවිය. මත්ද්‍රව්‍ය ඇබ්බැහිතාව සහිත සේවාලාභීන් විසින් භාවිත කරන ලද මත්ද්‍රව්‍යයන්ගේ ස්වභාවය මත ඔවුන් වෙතින් පෙන්නුම් කරන ලද කායික බලපෑම්හි ස්වභාවයෙහි ද සුවිශේෂීතා අවබෝධ කරගත හැකිවිය. අයිස් භාවිත කළ පිරිස් තුළ අලසබව, නිදිමතගතිය, පෙනහළු ආශ්‍රිත ආබාධ සහ ඇදුම ආදි කායික ව්‍යාධි තත්ත්වයන් දැකගත හැකිවිය. එසේම ගංජා භාවිත කළ පුද්ගලයින් තුළ කල් පවතින කැස්ස, ස්වසන ආබාධ හා නිදිමත ගතිය ආදිය දැකගත හැකිවිය. හෙරොයින් භාවිත කරන්නන් පෙනහළු ආබාධ, ආමාශයික ප්‍රදාහය, අලසකම යන ලක්ෂණ පෙන්නුම්කරනු ලැබීය. LSD භාවිත කළ පිරිස් වෙතින් වියළි කැස්ස සහ ශරීරයේ ක්‍රියාශීලීත්වය නොමැතිවීම යන ලක්ෂණ ඉස්මතු විය.

"බලන්නකෝ මිස් මාගේ ඇගේ හැටි මම ඉස්සර ලස්සන කොල්ලෙක් දැන් ඇට කටු ටික විතරයි මට හරි වෙහෙසයි දවසම නිදා ගන්න හිතෙනවා කුලියක් වත් කර ගන්න බැහැ ඇදුම හොදටම මේ ජරාව බීමේ ප්‍රතිඵල තමයි" (කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා, 2022)

"කොහේ මොනදේ වුනත් අපි තමයි ඒ හැමදේටම පළි. දැන්නම් අපිට අපිවම එපාවෙලා තියෙන්නේ. අපි කොච්චර හොඳ විදියට ජීවත්වෙන්න උත්සාහ කළත් වැඩක් නෑ. අපි ජීවිතේ වරද්දගත්ත අය " (කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා, 2022) මීට අමතරව කුමන මත්ද්‍රව්‍ය භාවිත කළත් පහත සඳහන් කායික වෙනස්කම් පොදුවේ ඔවුන් වෙතින් පෙන්නුම් කරනු ලැබීය.

- ශරීරය කෘෂවීම
- ශරීරයේ බාහිර පෙනුම වෙනස්වීම
- ආමාශයික ප්‍රදාහය
- කෑම අරුචිය
- සංවේදන ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරීත්වයේ දුර්වලතා

මේ අනුව පැහැදිලි වන්නේ මත්ද්‍ර විය භාවිතය සමස්ත කායික ක්‍රි යාකාරීත්වයටම බලපෑම් කරන බවය.

මානසික ගැටලු

මත්ද්‍ර වියල භාවිතයේ කායික බලපෑම මෙන්ම මානසික බලපෑම ද සලකා බැලිය යුත්තේ එමගින් පුද්ගලයාගේ මානසික පැතිකඩට ද සුවිශේෂී බලපෑමක් එල්ල කරන නිසාවෙනි. මත්ද්‍රයව්යි භාවිතය නිසා පුද්ගලයින් වෙතින් පෙන්නුම් කරන ලද මානසික ව්‍යාකකූලතාවන් පහත පරිදිවේ.

- මදිරාබාධය
- භ්‍රාාන්ති හා මායාවන්
- සියදිවිනසා ගැනීමේ සිතුවිලි
- අමතක වීම්
- ව්‍යාාකූල මානසිකත්වය
  එසේම මෙවැනි මත්ද්‍රමව්යම පුද්ගල පෞරුෂයට ඇතිකරන බලපෑම ද අති විශාලය. මෙම නියැදියේ සියලුම පුද්ගලයින්ගේ පෞරුෂ ගැටලු පැවති අතර ඒවා මෙසේ සඳහන් කළහැකිය.
- ස්වායක්තභාවයේ අඩුලුහුඩුකම්
- දුර්වල සම්බන්ධතා - සම්බන්ධතා ආරම්භ කිරීමට ඇති ගැටලු මෙන්ම සම්බන්ධතා පවත්වා ගෙන යාමේ ගැටලු මෙන්ම සම්බන්ධතාවන්ගෙන් පලායාමේ ප්‍රමවණතාව
- පරිසරයෙන් හා සමාජයෙන් ඉවත් වී සිටීමේ ලක්ෂණය
- වගකීම් විරහිත බව
- හුදෙකලා බව ප්‍රිතයකිරීම
- හැකියාවන්ගේ පවතින ඌනතා
- ආත්ම පරාජිත චින්තන රටාව
- යොවුන්වියේ අර්බුධ සමනය වී නොතිබීම
- මානසික අක්‍රඅමතාවලට ගොදුරුවීමේ ප්‍රයවණතා

මෙවැනි ඇබ්බැහිතා සහිත පුද්ගලයින් තුළ ප්‍රමධාන වශයෙන් ස්වායක්තතාවයේ අඩුලුහුඩුකම් අවබෝධ කර ගත හැකිවිය. එනම් තරුණ අවධියට පත්වන පුද්ගලයෙකු සෞඛ්‍යඩ සම්පන්න ජීවන රටාවක් ගත කළා නම් මූලික වශයෙන් පුද්ගලයාගේ ස්වාධීනත්වය ගොඩනැගිය යුතුය. නමුත් මෙවැනි පුද්ගලයින් තුළ ස්වායක්තතාවයේ පහත සඳහන් ගැටලුකාරී තත්ත්වයන්හඳුනා ගත හැකිවිය.

- ස්වසංකල්පයේ පවතින දුර්වලතා
- තමාට තමාව පාලනය කර ගැනීමේ ගැටලු
- චින්තන ශක්තියේ පවතින ඌනතා
- දුර්වල ආත්ම ශක්තිය
- පුද්ගල ප්‍රමහලතාවඅඩුපාඩු පැවතීම
- හුදෙකලා බව ප්‍රිුයකිරීමේ ස්වභාවය

මෙම නියැදිය තුළින් පැහැදිලිව දැකගත හැකිවිය. එහිදී පුද්ගලයා ජීවත්වන පරිසරයෙන්, සමාජයෙන් මෙන්ම පුද්ගල සම්බන්ධතා ජාලයෙන් හුදෙකලා වී සිටීම දැක්විය හැකිය. මෙවැනි

පුද්ගලයින් බොහෝ අවස්ථාවලදී මත්ද්‍රව්‍යයක නිසා ඇතිවන ප්‍රතිවිපාක සමඟ ජීවත් වන නිසා මොවුන් බොහෝ වේලාවට වගකීම් භාරදීමට අපහසු පුද්ගලයින් බව පැහැදිලි විය. වගකීම් භාරදුන්නද ඒවා ඉටුකිරීමෙහි මනාප්‍රේරණයක් මොවුන් වෙතින් දැකගත නොහැකිවිය. තවද මෙවැනි තත්ත්වයන් පදනම් කරගනිමින් මොවුන් බොහෝවිට හුදෙකලා බව ප්‍රකාශකරන පුද්ගලයින් වශයෙන් හඳුනා ගත හැකිවිය. තවද මත්ද්‍රව්‍යපා භාවිතය හා බැඳුනු අත්දැකීම් හා සංජානනයන් පදනම් කර ගනිමින් ආත්මපරාජිත චින්තන රටාවක් පැවතිබව දැකගත හැකිවිය. ඒ තුළ පහත ආකාරයේ ආත්ම ප්‍රකාශනයන් හඳුනා ගත හැකිවිය.

"කොච්චර හොඳ කෙනෙක් වෙන්නඋත්සාහ කළත් අපිව සමාජය හංවඩු ගහන්නේ මy නරක විදියට. ඒ නිසා මට මම ගැන තියෙන්නේ මහා දුකක්" (කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡා, 2022)

"කොහේ මොනදේ වුනත් අපි තමයි ඒ හැමදේටම පළි. දැන්නම් අපිට අපිවම එපාවෙලා තියෙන්නේ. අපි කොච්චර හොඳ විදියට ජීවත්වෙන්න උත්සාහ කළත් වැඩක් නෑ. අපි ජීවිතේ වරද්දගත්ත අය" (කේන්ද්‍ර ගත සම්මුඛ සාකච්ඡා2022)

මේ අනුව පැහැදිලි වන්නේ මෙවැනි පුද්ගලයින් තුළ ආත්ම පරාජිත චින්තන රටාව නිර්මාණය වීමෙහි ලා සමාජ ප්‍රතිචාර බලපා ඇති බවය. එනම් සාපේක්ෂව මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් කෙරෙහි සමාජය දක්වන ප්‍රතිචාරය මත ඔවුන් තමාව අර්ථකථනය කරනබවය. යොවුන් වියේ අර්බුද සමනය වී නොතිබීම ද මෙම තරුණයින් වෙතින් දැකගත හැකි වූ ප්‍රවධානමානසික ලක්ෂණයකි. තරුණ අවධිය යනු ජීවිතයේ බොහෝ දේ ළඟාකර ගැනීමට අපේක්ෂිත කාලවකවානුවකි. එහිදී පුද්ගල කුසලතා ආකල්ප මෙන්ම සිතුම් පැතුම් සමාජයට ගැලපෙන ආකාරයට සකස් කර ගැනීමටත් එහිදී මතුවන අභියෝග ජය ගැනීමටත් වෙහෙසෙන අවධියකි. නමුත් මත්ද්‍රව්‍යකිනිදේ සඳහා ඇබ්බැහිවීම තුළ මෙම පුද්ගලයින්ගේ තරුණ අවධිය තෘප්ත කර අයුරින් ගෙවීමට නොහැකි වී ඇති බව පැහැදිලිවිය. එහිදී සමස්ත ජීවිතයම මත්ද්‍රව්‍ය වෙනුවෙන් කැප කිරීම තුළ ඔවුන්ට ජීවිතයේ අහිමි වූ අපේක්ෂාවන් මත්ද්‍රව්‍ය ඇබ්බැහිතාවෙන් මිදුන ද නැවත ළඟාකර ගත නොහැකිවීම ඔවුන් මුහුණපාන සුවිශේෂී ගැටලුවකි. එසේම මේ කාලවකවානුව තුළ පුද්ගලයින් තමා අවට පිරිස් අනුකරණය කරමින් ස්වකීයත්වය ධනාත්මක ලෙස සකස් කර ගත්ත ද මොවුන් බොහෝවිට අනුකරණය කර ඇත්තේ තවත් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වී ජීවිතයේ ඍණාත්මක ප්‍රවතිවිපාක අත්විඳින පුද්ගලයින් පිරිසක් ය. ඒ තුළ මෙවැනි පුද්ගලයින් විසින් තරුණ අවධියේ දී තෘප්ත කර ගත යුතු තත්ත්වයන් ඉටුකර ගත නොහැකිවීමේ පසුතැවීමක් ඔවුන් වෙතින් දැකගත හැකි විය.

"ඇත්තටම ඒ කාලේ අපිට මග පෙන්වන්න කෙනෙක් හිටියේ නෑ. අඩුම තරමේ මුලින්ම මේක ගත්ත දවසේ අම්මා මට ගැහුවනම් අද මට මේක වෙන්නේ නැහැ.මම ඒ කාලේ සම්පූර්ණ විශ්වාස කලේ යාලුවෝ විතරයි. දැන් අපේ වයසේ අනික් අය ඉන්න විදිය දැක්කහම අපි ගැනම ඇති වෙන්නේ ලොකු දුකක්' (කේන්ද්‍රනගත සම්මුඛ සාකච්ඡා , 2022).

මේ අනුව පැහැදිලි වන්නේ ඔවුන් වර්තමානය වනවිට මුහුණ පා තිබෙන තත්ත්වයත්,මෙම ඇබ්බැහිතාව නිසා මොවුන් මුහුණ පෑ තත්ත්වය පිළිබඳවත් ඔවුන් පසුතැවීමට ලක්වන බවය. මීට

අමතරව මත්ද්‍රව්‍යු භාවිතය නිසා ඔවුන් මුහුණ පා සිටින මානසික අක්‍රමමතාවන්හී සායනික ලක්ෂණ මෙසේ දැක්විය හැකිය.

- ආතතිය
- කාංසාව
- විශාදය
- භ්‍රාදන්ති හා මායාව
- ආවේගශීලීත්වය

මීට අමතරව මත්ද්‍රව්‍යය භාවිතය නිසා ඇතිවිය හැකි වෙනත් මානසික අක්‍රරමතා කිහිපයකි.

- මානසික සරණතාවය - මත්ද්‍රතව්‍යි නිසා සතුට ලැබේ යැයි සමහරු ඉගෙන ගෙන ඇත.

එවැනි සතුටුවන සෑම අවස්ථාවකම මොවුන්ට මත්ද්‍රව්‍යර අවශ්‍යිවේ.මත්ද්‍රතව්‍ය නැත්නම් ඔවුන්ට සතුටු විය නොහැක. මෙය මානසික සරණතාවයයි. මත්ද්‍රටව්‍යව මද්‍යසාර වල ඇත්ත අපහසු අත්දැකීම් යටපත් කර උගන්වන ලද හැසිරීම් පෙන්වමින් ජීවත්වන්නට සිදුවීම මානසික ගැටලුවකි. මෙය ද ඉතා ප්‍රරබල වැඩිවශයෙන් හඳුනා නොගන්නා හානියකි (ප්‍රමන්ගිල,2020,33).

සමාජීය ගැටලු

මත්ද්‍ර වියල භාවිත කරන්නන්හට ඇති සමාජ බලපෑම පිළිබඳ සාකච්ජා කිරීමේදී එය පුද්ගලයා ජීවත්වන සමාජ වට පිටාවෙහි ස්වභාවය මත තීරණය වන බව පැහැදිලි වේ. මෙහිදී වැඩි වශයෙන් මධ්‍යජම පාන්තික සමාජ පසුබිමකින් එන පුද්ගලයින් නියැදිය තුළ හඳුනා ගත හැකි අතරම, එක් අයෙක් පමණක් ඉහළ සමාජ පන්තියට අයත් බව හඳුනා ගත හැකි විය. කෙසේ වෙතත් මත්ද්‍ර ව්‍ය මිලදී ගැනීම සඳහා දෛනිකව විශාල මුදලක් වැය කිරීමට සිදුවීම ඔවුන් තුළ පැවති ආර්ථික ශක්තිය හීන කිරීමට හේතු වී ඇති බව පැහැදිලි විය. ඒ තුළ ඔවුන් බොහෝ ආර්ථික දුෂ්කරතා වලට මුහුණ පා ඇති බව පැහැදිලි විය. තවද මේ තත්ත්වය ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට ද සෘජුව ආර්ථිකමය ලෙස බලපා ඇතිබව ද පැහැදිලි විය. එනම් ආර්ථික තත්ත්වය අයත්වන පුද්ගලයා හා සම්බන්ධවන බාහිර පද්ධතියට ද මත්ද්‍රහව්‍යම මගින් බලපෑම් එල්ල වන බව පැහැදිලි වේ. මත්ද්‍රටව්‍යහ ඇබ්බැහිතාවයේ සීමාව කාල සීමාව තුළ ඔවුන් කොරතම් ආර්ථික දුෂ්කරතා වලට මුහුණ පැවත් ඒ පිළිබඳ නොසලකා දිගින් දිගටම මත්ද්‍රවව්‍ය භාවිතය සඳහා යොමුවීම කැපී පෙනෙන ලක්ෂණයකි. ඒ තුළ ඔවුන් සියලුදෙනාම මත්ද්‍රේව්‍ය ඇබ්බැහියට යොමුවන කාලසීමාවට වඩා පසුකාලීනව බොහෝ ආර්ථික දුෂ්කරතාවලට මුහුණ පා සිටි බව පැහැදිලි වේ. මත්ද්‍රව්‍යර සඳහා ඇබ්බැහිවීමත් සමඟ මොවුන් වෙතින් පෙන්නුම් කරන ලද සමාජ විරෝධී ක්‍රියාවන් මෙහිලා සාකච්ජා කළ යුතුය. අධ්‍යබයන නියැදිය ආශ්‍රෙයෙන් පෙන්නුම් කරන ලද සමාජ විරෝධී ක්‍රිරයා මෙසේ දැක්විය හැකිය.

- ප්‍රරචණ්ඩත්වය
- කාන්තා හිංසනය
- සොරකම්
- ළමා හිංසනය
- සාපරාධී ක්‍රිනයා

මීට අමතරව අධ්‍යරයන නියැදියේ විවාහක පුද්ගලයින් සියලුදෙනාම (12 ක්) මත්ද්‍ර ව්‍යම භාවිත කරන කාල සීමාව තුළ අතෘප්ත කර විවාහ ජීවිත භාවිත කළ බව පැහැදිලි විය. නමුත් මොවුන්

අතුරින් කිහිපදෙනෙකුගේ පවුලේ සාමාජිකයින් (බිරිඳ,දෙමාපියන් හෝ සහෝදර සහෝදරියන්) මත්ද්‍රව්‍යයෙ ඇබ්බැහිතාවෙන් මිදී පුනරුත්ථාපනය සඳහා යොමුකර ඇති බව පැහැදිලිවේ.

"මගේ නෝනා තමයි මාව මෙතනට යොමු කලේ. මේවා පාවිච්චි කරන කාලේ මම ගොඩක් නෝනාට දුක් දුන්නා. එයා හරියට විඳෙව්වා මම නිසා. ඒත් එයාගේ උත්සාහය නිසා තමයි මම මේ තැනින් ගොඩ ආවේ"(කේන්ද්‍රීය ගත සම්මුඛ සාකච්ඡා 2022)

නමුත් ඇතැම් පුද්ගලයින්ගේ විවාහ ජීවිතය බි `ඳ වැටීමට මත්ද්‍ර ව්‍යයේ භාවිතය හේතු වී ඇත. එසේම පවුල් පද්ධතියට පුද්ගලයාගෙන් ඉටු විය යුතු කාර්යයභාරය මග හැරීයාමට ද මත්ද්‍රව්‍යව භාවිතය හේතු වී ඇත. මේ තත්ත්වය පද්ධති න්‍යා යෙහි එන මධ්‍යය පද්ධතිය ඇසුරින් පැහැදිලි කළ හැකිය. එනම් මෙමගින් පුද්ගලයාගේ අන්‍යෝන්‍ය සම්බන්ධතා වලට බලපෑම් කරයි.

උදා - අඹුසැමි සබඳතා දුර්වල වීම.
දරුවන්ගේ අධ්‍යාපනය අඩපන වීම.

තවද මෙවැනි මත්ද්‍රව්‍යඅ ඇබ්බැහිතාව සහිත පුද්ගලයින් කිසියම් සමාජයක සමාජ ගත වීම, එම සමාජයෙහි පවත්නා සමාජ පර්යාය හානි වීමට හේතුවන බව පැහැදිලි වේ. තවද එම සමාජයේ සමාජ අපගාමී චර්යා හා අපරාධ වර්ධනය වීමට මෙකී තත්ත්වය හේතු වේ. දරුවන් මෙන්ම තරුණ ප්‍රජාව මත්ද්‍රව්‍යෙ සඳහා යොමුකර ගැනීමට ද මෙවැනි පුද්ගලයින් හේතු වේ. එසේම මත්ද්‍රව්‍යර ඇබ්බැහිතාව සහිත පුද්ගලයින් ඔවුන් ජීවත්වන සමාජයේ මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් භූමිකා මොඩලයන් බවට පත්ව ඇති බවද අධ්‍ය යන දත්ත ඇසුරින් තහවුරුවිය.

සමාලෝචනය හා නිගමන

අධ්‍යෝයන දත්ත ඇසුරින් ලබා ගත් දැනුම සාරාංශගතකරණය සිදුකරන අතරම, එමගින් නිගමන හා යෝජනා කිහිපයක් ඉදිරිපත් කෙරේ.

ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ මෙන්ම අනෙකුත් රටවල ද මතුව ඇති සමාජ ප්‍ර ශ්න අතුරින් මත්ද්‍රව්‍යම ඇබ්බැහිතාව ප්‍ර ධාන සමාජ ප්‍රශ්නයක් ලෙස හඳුනා ගත හැකිය. සමකාලීන සමාජය තුළ මත්ද්‍රව්‍යම ඇබ්බැහිතාවට ලක්වන පාර්ශ්ව අතුරින් තරුණ ප්‍රජාව මත්ද්‍රව්‍ය. සඳහා ඇබ්බැහිවීමේ වැඩි ප්‍රවණතාවක් දැකගත හැකිය. ඒ අනුව මෙම අධ්‍යයනය තරුණ මත්ද්‍රව්‍යම ඇබ්බැහිතාව පිළිබඳ කේන්ද්‍රගත විය. රටක අනාගත සංවර්ධනයෙහි මූලික ගාමක බලවේගය ලෙස තරුණ ප්‍රජාව හැඳින්විය හැකිය. එවැනි පසුබිමක තරුණයින් මත්ද්‍ර ව්‍ය වැනි අහිතකර ප්‍රතිවිපාක වල ගොදුරක් බවට පත්වීම ඛේදනීය තත්ත්වයකි. එබැවින් මත්ද්‍රව්‍යර ඇබ්බැහිතාව සඳහා ලක්වන තරුණ ප්‍රජාව ඉන් වළක්වා ගැනීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව ඇත.

අධ්‍යයනය ඔස්සේ මූලික වශයෙන් පුද්ගල මත්ද්‍රව්‍යප ඇබ්බැහිතාව නිසා පුද්ගලයාගේ ජීවිතයේ සියලු පැතිකඩ සඳහා බලපෑම් එල්ල වන බව නිර්ණය විය. ඒ අනුව ප්‍රධාන වශයෙන් පුද්ගලයින්ගේ කායික, මානසික හා සමාජීය පැතිකඩයන්ට බලපෑම් එල්ල වන බව පෙනේ. ප්‍රධාන වශයෙන් පුද්ගල ශරීරයේ පවතින සමබරතාව සාමාන්‍ය පැවැත්ම හා සම්බන්ධීකරණයට මත්ද්‍රව්‍ය මගින් හානි කරයි. ඒ ඔස්සේ මත්ද්‍ර ව්‍යව ඇබ්බැහිතාවෙහි කායික ප්‍රතිවිපාක පෙන්නුම්

කරනු ලබයි. පුද්ගලයින්ගේ මානසික පැතිකඩ දෙස අවධානය යොමු කිරීමේදී මත්ද්‍ර්ව්‍යි මගින් මානසික සංවර්ධනය අඩාල කරන අතරම, මානසික සුවතාව අහිමි කරයි. පුද්ගලයාගේ සමස්ත ජීවවිද්‍යාසත්මක පැවැත්මට කායික මෙන්ම මානසික සමබරතාව අතර සම්බන්ධීකරණය අත්‍යවශ්‍යා වන අතරම,මත්ද්‍ර ව්‍යත මගින් එය බිඳදමනු ලබයි. කායික විද්‍යාමත්මක බලපෑම පුද්ගල මානසික යහපැවැත්මටත්, මානසික බලපෑම කායික යහපැවැත්මටත් හානිකර ලෙස බලපාන බව මේ ඔස්සේ තහවුරු වේ. පුද්ගලයා යනු හුදෙකලා වූ ජීවියෙකු නොවන අතර, පුද්ගලයා යනු සමාජීය සත්ත්වයෙකි. ඒ අනුව පුද්ගලයා සමස්ත සමාජයටත් සමාජ ක්‍රියාකාරීත්වය පුද්ගල ජීවිතයටත් අන්‍යෝන්‍ය වශයෙන් බලපෑම් කරනු ලබයි. ඒ බව මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඇති සමාජ බලපෑම පිළිබඳ සාකච්ඡා කිරීමේදී තවදුරටත් තහවුරු විය. විශේෂයෙන් පුද්ගලයාගේ පවුල් පද්ධතියට මෙන්ම එහි ක්‍රියාකාරීත්වයට ත්පවුලේ අනෙකුත් සාමාජිකයින්ටත් මත්ද්‍රව්‍යය ඇබ්බැහිය නිසා සෘණාත්මක බලපෑම් එල්ල වන අතරම, සමස්ත සමාජයේ සුගම පැවැත්මට මෙමගින් හානිවේ. ඒ අනුව නූතන සමාජය තුළ මතුව ඇති ප්‍රධාන සමාජ ප්‍රශ්නයක් (major social problem) මත්ද්‍රව්‍යවිය ඇබ්බැහිතාව නිර්වචනය කළ හැකිය.

අධ්‍යයනය ඇසුරින් යෝජනා කරණු ලබනුයේ, තරුණ මත්ද්‍රව්‍ය ඇබ්බැහිය වැළැක්වීම සඳහා මත්ද්‍ර ව්‍ය ඇබ්බැහිතාවයෙහි ප්‍රතිවිපාක පිළිබඳ සමාජ දැනුවත්භාවය වර්ධනය කිරීම හරහා ප්‍රධාන වශයෙන්ම මත්ද්‍රව්‍යය ඇබ්බැහිතාව සඳහා පුද්ගලයෙකු යොමුවීමට පෙර එම තත්ත්වය වළක්වා ගැනීම වඩාත් ප්‍රතිඵලදායක බවය. ඒ තුළ ප්‍රධාන වශයෙන් ම සමාජ මට්ට මේ මත්ද්‍රව්‍ය ඇබ්බැහිතාව නිසා ඇතිවන සෘනාත්මක බලපෑම පිළිබඳ සමාජ දැනුවත්භාවය වර්ධනය කළ යුතුය. එහිලා ප්‍රධාන වශයෙන්, මත්ද්‍රව්‍යය ඇබ්බැහිතාවෙහි ඇති කායික මානසික හා සමාජීය බලපෑම පිළිබඳ සංවේදීභාවය පුද්ගල හා ප්‍රජා මට්ටමෙන් ඇති කිරීම. මත්ද්‍රව්‍යය භාවිතය සඳහා ඇති වගකීම සමාජය වෙත පැවරීම. එහිදී එක් පුද්ගලයෙකුට මෙම ගැටලුව කේන්ද්‍රද ගත නොකර මුලු මහත් සමාජයම ඒ සඳහා ක්‍රියාත්මක විය යුතුය. මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් සමාජ අවමානයට හා ලේබල්කරණයට ලක් නොකිරීම. සමාජ සංස්ථාවන්හි කාර්යභාරයන් මත්ද්‍රව්‍ය ඇබ්බැහිතාව වැළැක්වීම සඳහා යොදා ගැනීම පාසල් අධ්‍යාපනය සඳහා මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් භාවය විධිමත් ආකාරයෙන් ඇතුලත් කිරීම. පූර්ණ පෞරුෂයක් හා ස්වයං ශික්ෂණයක් සහිත පුරවැසියන් සමාජයට බිහිකිරීමේ වගකීම සමාජය වෙත පැවරීම. ඒ සඳහා උපදේශකවරුන් හා සමාජ වැඩකරුවන් වැනි වෘත්තිකයින්ගේ මැදිහත්කරණය ලබාදීම. මත්ද්‍ර ව්‍යන පිළිබඳ පවතින ධනාත්මකමත වාදයන් බිඳ හෙලමින් එහි ඇති සැබෑ ප්‍රතිවිපාක පිළිබඳ සමාජ මතවාදය ගොඩනැගීම.

මේ අනුව පැහැදිලි වන්නේ මත්ද්‍රව්‍ය ඇබ්බැහිතාව මුලින් උපුටා දැමීම සඳහා පුනරුත්ථාපන ක්‍රියාවලිය සාර්ථක ක්‍රමවේදයක් වුවත් එම ක්‍රියාවලියම පමණක් මේ සඳහා ප්‍රමාණවත් නොවන බවය. මේ සඳහා සමාජයේ ව්‍යුහාත්මක හා බුද්ධිමය වෙනසක් ඇති කළ යුතුය. මත්ද්‍රව්‍ය, ජාවාරම වැළැක්විය යුතු අතරම, පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළැක්විය හැකි ක්‍රමවේද භාවිත කළයුතුය. මත්ද්‍රව්‍ය සමාජය තුළ පැවතුනත් ඒවා භාවිත නොකිරීමට තරම් ප්‍රමාණවත් ශක්‍යතතාවක් පුද්ගලයින් තුළ නිර්මාණය කළයුතුය. ඒ සඳහා සමාජ වැඩකරුට පුනරුත්ථාපන ක්‍රියාවලියෙන් ඔබ්බට ගිය පුද්ගල මට්ටමේ, පවුල් මට්ටමේ මෙන් ම ප්‍රජා මට්ටමේ කාර්යභාරයක් ඉටු කළ හැකි බව ද මෙහිලා දැක්විය හැකිය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කරුණානායක, දිනේෂ්. (2012). *මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වීම සහ පුනරුත්ථාපනය*. කිරිදිවැල: කල්පිත ප්‍රකාශකයෝ.

ගමාරච්චි, ලීලානන්ද. (2004). *මදුවිත අත්හරින්නේ මෙහෙමයි*. මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

පඩුවාවල, සරත්. (2014). *මද්‍යසාර භාවිතයෙන් මිදෙන හැටිම්පහ*: මින්සර පොත් ප්‍රකාශක.

ප්‍රවනාන්‍ෂුම. (2017). *දුම්වැටි, මද්‍යසාර, ගංජා, හෙරොයින් පිළිබඳ අපට කළ හැකිදේ*. කොළඹ: ජාතික මත්ද්‍රව්‍ය, නිවාරන මෙහෙයුම් ඒකකය, බුද්ධශාසන අමාත්‍යාංශය.

බණ්ඩාර, ටී. එච්. එම්. එස්. සී. (2004). *සමාජය, පෞරුෂය හා මත්ද්‍රව්‍ය භාවිතය*. නුගේගොඩ: කොලිටි ප්‍රින්ටර්ස්.

බාලසූරිය, ඒ. එස්. (2012). *මද්‍යපානය, දුම් පානය හා මත්ද්‍රව්‍ය සෞඛ්‍යයට බලපාන ආකාරය* වරකාපොළ: හෙළදිව ප්‍රකාශකයෝ.

වීරකෝන්, උපාලි. (2003). *මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම වර්ගීකරණය සහ නිෂ්පාදන රටා*. වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

නානායක්කාර, ශාක්‍ය . (2004). *හෙරොයින් භාවිතයෙන් නිදහස්වීම* . කොළඹ: ෆෝරුට් පබ්ලිෂර්ස්.

De Silva, P., & Fonseka, P. (2008). Drug addicts and their behaviour related to drug addiction among the institutionalized addicts in the Galle district. *Galle Medical Journal.*

Espejo, R. (2002). *Drug abuse*. San Diego: Bonnie Szumski.

Fekjaer, H. O. (1993). *Alcohol and illicit drugs*. IOGT Alcohol and Drug Information Center (ADIC), Sri Lanka.

Mahir, I. L. M. (2020). Social aspects of drug addiction in Sri Lanka. *Journal of Politics and Law*, *13*(2). Canadian Centre of Science and Education.

United Nations Office on Drugs and Crime. (2017). *World drug report 2017.*